# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 2012 අංක 10 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 2012 මාර්තු මස 30 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2012 මාර්තු මස 30 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන්
පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 2.50 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# 2012 අංක 10 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2012 මාර්තු මස 30 වන දින]

එල්.ඩී.—ඕ. 7/2012.

## 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2012 අංක 10 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අදාළ වගන්තිවල ක්‍රියාත්මක වන වෙනස් නිශ්චිත දින සඳහන් කර ඇත්නම් මිස, 2012 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

**2.** 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

*2011 අංක 18 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(2) 2 වන සහ 3 වන වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද—

(i) ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගනිමින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් හඳුනාගත් රජය විසින් බදු මුදල් ගෙවීම දරනු ලබන යම් විශේෂිත ව්‍යාපෘතියක් සඳහා භාවිත කිරීම පිණිස යම් භාණ්ඩයක් ආනයනය කිරීමේ දී එසේ ආනයනය කළ භාණ්ඩය සඳහා අයවිය යුතු බදු මුදල ආවරණය වන සමාගම් ඇපකරයක් සැපයීමට යටත්ව, ඒ ව්‍යාපෘතිය සම්පූර්ණ වීමෙන් පසුව ඒ භාණ්ඩය ප්‍රතිඅපනයනය කරන තෙක් වූ කාලය දක්වා 2009 ජූලි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි; හෝ

(ii) අවස්ථාවෝචිත පරිදි, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 16ඈ හෝ 17අ වගන්තිය යටතේ බද්දෙන් නිදහස් කිරීම සඳහා සුදුසුකම්ලත් යම් ව්‍යවසායයක් විසින්, බද්දෙන් නිදහස් කරන්නා වූ 1978 අංක 4 දරන ජාතික රාජ්‍ය සභාවේ ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතුළත් වූ

2—PL006663—5,865 (2012/03)

ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති කාර්ය සඳහා එම ව්‍යවසායයේ භාවිතය පිණිස ව්‍යපෘතිය ක්‍රියාත්මක වන කාලසීමාව තුළ දී පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ වන යම් භාණ්ඩයක් ආනයනය කිරීමේ දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතුළත් වූ ගිවිසුමේ නිශ්චිතව සඳහන් කරන ලද කොන්දේසි සම්පූර්ණ කිරීමට සහ එසේ ආනයනය කළ භාණ්ඩ සඳහා අයවිය යුතු බදු මුදල ආවරණය වන බැංකු ඇපකරයක් සැපයීමට යටත්ව,

රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බදු මුදල් එකතු කිරීම විලම්භනය කරනු ලැබිය යුතු ය.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.